**#mediaethicsSL #EnglishPress #lka #DailyMirror #April09**

කාන්තාවන් පිරිසක් විසින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් පිළිබඳව වාර්තා කිරීමේදී ඩේලි මිරර් පුවත්පත මගින් යොදාගෙන ඇති භාෂා භාවිතය මනා මාධ්‍යකරණයකට කෙතරම් යෝග්‍ය වන්නේ දැයි විමතියක් පාඨක අපට ඇති වේ.

මෙහිදී එම මාධ්‍යවේදියා විසින් එම සිදුවීම සම්බන්ධයෙන් පූර්ව විනිශ්චයක හිඳ, පුවතෙහි සඳහන් වන කණ්ඩායම පමණක් නොව, ඔවුන් විසින් එතැනදී නියෝජනය කරනා සමස්ත කාන්තාවම වෙනස් ලෙසින් හැඟවුම් කරනා, පහත හෙලනා ස්වරයක් යොදා ගනී. ලිපියේ යෙදී ඇති nagging, bemoan, nitpick, lamenting වැනි වචන ඊට උදාහරණ වේ.

අප පුවත්පතකින් බලාපොරොත්තු වන ආචාරධාර්මික වූ මාධ්‍යකරණය මෙය ද? මෙම පුවත කියවන පාඨක අපට පැන නඟිනා ගැටළුව එයයි.